දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650
ලේකම් / செயலாளர் / Secretary } 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax } 011 - 2876169 / 011 - 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail } info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No. } PSC/APP/1/20/2014
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2019.10. 10

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 03/2019

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම

2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 පරිදි විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

02. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධරයකු, සේවා අවශ්‍යතාව මත නැවත සේවයේ යෙදවීම කොන්ත්‍රාත් පදනම මත පමණක් සිදු කළ යුතුය. (1991.10.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/91 මඟින් ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 157 මඟින් ද මෙම කරුණ අවධාරණය කර ඇත).

03. විශ්‍රාමය, මියයාම, නව තනතුරු ඇති කිරීම, ඉල්ලා අස්වීම, විනය හේතු මත සේවයෙන් පහ කිරීම, උසස්වීම් යන හේතු නිසා ඇතිවන පුරප්පාඩු සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට යටත්ව විශ්‍රාමිකයින් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගත හැකිය.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි XIII පරිච්ඡේදයේ 155 වන රීතිය මඟින් දක්වා ඇති අවස්ථාවන්ට භාජනය වී ඇති විශ්‍රාමිකයින් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගැනීමට සුදුසුකම් නොලබන්නේය.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නැවත සේවයේ යෙදවීමට අනුමැතිය ඉල්ලුම් කරන අවස්ථාවේ දී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

I. අදාළ තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක් විය යුතු අතර එහි පුරප්පාඩුවක් පැවතිය යුතුය;

II. තනතුරට අදාළ අනුමත සේවා ව්‍යවස්ථාවක් හෝ බඳවාගැනීමේ පරිපාටියක් පැවතිය යුතුය;

III. සියළු දීප ව්‍යාප්ත සේවා තනතුරු සඳහා පත්වීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන බැවින් පළාත් සභා තුළ පවතින දීප ව්‍යාප්ත සේවාවලට අයත් තනතුරු සඳහා විශ්‍රාමික නිලධරයන් නැවත සේවයේ යෙදවීමේදී ද එම පත්වීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. ඒ සඳහා ඉල්ලුම් කිරීමේදී පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය පළාත් සභා විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට පිටපතක් සහිතව, අදාල සේවාවේ පරිපාලන බලධරයා මගින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

IV. පුරප්පාඩුව සම්පූර්ණ කරන තෙක් එම පුරප්පාඩු තනතුරේ රාජකාරි වැඩබැලීම/ රාජකාරී ඉටුකිරීම/ රාජකාරී ආවරණය මගින් ඉටු කර ගත නොහැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පෞද්ගලික නිර්දේශය සහිත ඉල්ලීමක් අමාත්‍යාංශ ලේකම් වරයා/ පළාත් ප්‍රධාන ලේකම් වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යාංශ ලේකම් වරයා/ පළාත් ප්‍රධාන ලේකම් වරයා විසින් ස්වකීය පෞද්ගලික නිර්දේශය සමඟ එකී ඉල්ලීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය;

V. උසස්වීම් අපේක්ෂාවෙන් පසුවන නිලධාරීන් මගින් අදාල පුරප්පාඩුව වැඩ බැලීම/ රාජකාරි ඉටු කිරීම හෝ රාජකාරි ආවරණය මත සම්පූර්ණ කිරීමට හැකියාව තිබියදී කිසිදු විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ නොයෙදිය යුතුය. (මේ බව 2018.02.27 දිනැති අංක/18/විවිධ (008) අමාත්‍ය මණ්ඩල තීරණය මගින්ද අවධාරණය කර ඇත);

VI. කිසිදු අයුරකින්වත් විශ්‍රාමික නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම නිසා සේවා ව්‍යවස්ථා/ බඳවාගැනීම් පරිපාටි අනුව සුදුසුකම් ලබන නිලධරයකුට ලබා දිය යුතු උසස්වීම් ලබා දීම ප්‍රමාද නොකළ යුතුය;

VII. විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී සෑම විටම ස්ථාන මාරු අපේක්ෂාවෙන් පසුවන නිලධාරීන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතුය;

VIII. විශ්‍රාමික නිලධරයෙකු කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවනු ලැබ ඇති විටකදී ද ඔහුගේ පත්වීම නොසළකා එම තනතුරු වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියේදී පුරප්පාඩු ලෙස ප්‍රසිද්ධ කිරීමට අදාළ බලධරයන් කටයුතු කළ යුතුය;

IX. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සිය නිල වෙබ් අඩවිය තුළ පුරප්පාඩු තනතුරු පෙන්නුම් කිරීමේ දී විශ්‍රාමික නිලධරයෙකු නැවත සේවයේ යොදවා ඇති තනතුරු ද පුරප්පාඩු ලෙස පෙන්වා තිබිය යුතුය. මෙම කරුණ අදාළ සේවාවන්හි පත්කිරීම් බලධරයින් හා සියලුම පරිපාලන බලධරයන්ගේ අධීක්ෂණයට ලක් කළ යුතුය;

X. විශ්‍රාමික නිලධරයෙකු නැවත සේවයේ යෙදවීම නිසා සේවයේ නියුතුව සිටින නිලධරයෙකුට කුසලතාව මත හිමි විය යුතු සේවා ස්ථානයක් අහිමිවීමේ අවස්ථාවක් ඇති නොවිය යුතුය.

උදා : පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන්ගේ පත්වීම් ලබාදීමේ දී ඔවුන්ගේ කුසලතාවය මත හිමිවන ස්ථානයක් නැවත සේවයේ යෙද වූ වෛද්‍යවරයෙකු පත් කර සිටීම හේතුවෙන් අහිමි නොකළ යුතුය;

XI. නැවත සේවයේ යොදවන විශ්‍රාමිකයා අදාළ තනතුරෙහි සේවය කිරීමට කායික/ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත බව රජයේ වෛද්‍ය නිලධරයකු විසින් ලිඛිතව සහතික කර තිබිය යුතුය;

XII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ EST 01 ආකෘතිය මඟින් පමණක් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය. එහි සඳහන් කර ඇති තොරතුරු වඩාත් නිවැරදිව සටහන් කර ඇති බවට අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම් පෞද්ගලිකව වගකීමට බැඳී සිටිය යුතු අතර මේ යටතේ කරනු ලබන ඉල්ලීම් නිශ්චිත රාජකාරි ස්ථානයක පවතින නිශ්චිතව සඳහන් කරන ලද තනතුරක් සඳහාම විය යුතුය. පත්වීම් ලිපියද ඒ අනුවම නිකුත් කරනු ලැබේ;

XIII. විශ්‍රාමිකයින් නැවත සේවයේ යෙදවීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක්ම රාජකාරී අවශ්‍යතාවය මතම අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ විසින් සිදුකරනු ලබන ඉල්ලීමක් විය යුතු අතර

විශ්‍රාමිකයින්ගේ පෞද්ගලික ඉල්ලීම් මත නිර්දේශ කර එවන ඉල්ලුම්පත්‍ර හේතු විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ;

XIV. මෙම කොමිෂන් සභාවෙන් ලබා ගත් පූර්ව අනුමැතිය මත මිස, ඉදිරියේ දී අනුමැතිය ලබාගැනීමේ අපේක්ෂාවෙන් කිසිදු විශ්‍රාමික නිලධරයෙකු නැවත සේවයේ නොයෙදවිය යුතු අතර අනුමැතිය ලබාදීමට ප්‍රමාණවත් කාල පරිච්ඡේදයක් ඇතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය;

XV. නැවත සේවයේ යෙදවීම එක් වසරක උපරිම වූ කාලයකට පමණක් සීමා කලයුතු අතර එම කාලය තුළදී එම තනතුර සඳහා සුදුසු අයකු ස්ථිරව පත් කළ යුතුය. කෙසේ වුව ද තවදුරටත් එම තනතුර සඳහා විශ්‍රාමික නිලධරයකු නැවත සේවයේ යෙදවීමට සිදුවීම වැළැක්විය නොහැකි තරමට සේවා අවශ්‍යතාවයක් පවතී නම් වෙනත් සුදුසු විශ්‍රාමික නිලධරයකු නැවත සේවයේ යොදවා ගැනීමට හෝ නොඑසේ නම්, සේවා බණ්ඩනයකින් යුක්තව පෙර විශ්‍රාමික නිලධරයාම නැවත සේවයේ යෙදවීම සඳහා මෙම චක්‍රලේඛය පරිදි ක්‍රියා කළ යුතුය;

XVI. සේවයේ අවශ්‍යතාව මත යම් නිලධරයෙකු මෙම චක්‍රලේඛය පරිදි නැවත සේවයේ යෙදවීම සිදු කළ ද එම පුරප්පාඩුව විධිමත් පරිදි සම්පූර්ණ කළ හැකිය.එසේ පුරප්පාඩු සම්පූර්ණ කළ වහාම (අනුමත කාලය ඉක්මවීමට පෙර වුව ද) එම නැවත සේවයේ යෙදවූ විශ්‍රාමික නිලධාරියාගේ සේවය අවසන් කිරීමට ආයතන ප්‍රධානීන් විසින් වග බලා ගත යුතුය. එසේ සේවය අවසන් කිරීම සඳහා මෙම කොමිෂන් සභාවේ අනුමැතියක් නැවත ලබා ගැනීම අවශ්‍ය නොවේ;

XVII. 2018.02.27 දිනැති අංක/18/විවිධ (008) දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මානව සම්පත් කළමනාකරණය කෙරෙහි දැඩි අවධානය යොමුකරමින් ඉදිරියේ දී ඇතිවන තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම හා බඳවාගැනීම්/ උසස්කිරීම් පිළිබඳ පස් අවුරුදු සැලැස්මක් සකස් කර ගත යුතු අතර එය යාවත්කාලීන කරමින් පවත්වා ගත යුතුය.එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම වාර්ෂික විගණනයට ලක් කළ යුතුය;

06. නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධරයන් සඳහා ගෙවනු ලබන දීමනා 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි හා එහි සංශෝධනයන් පරිදි තීරණය කරනු ලැබිය යුතුය.

07. මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන කරුණු හා ගැටළු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා කටයුතු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් :-

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - කරු.දැන ගැනීම සඳහා |
| 2. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය | - කරු.දැන ගැනීම සඳහා |
| 3. | විගණකාධිපති | - කරු.ක්‍රියා කිරීම සඳහා |
| 4. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව | - කරු.ක්‍රියා කිරීම සඳහා |
| 5. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව | - කරු.ක්‍රියා කිරීම සඳහා |